# ග්‍රාමීය සංවර්ධනය සඳහා කිතුල් කර්මාන්තයේ දායකත්වය.

## (කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරෙන්)

මෙම නිබන්ධනය කැලණිය විශ්වවිද්‍යාලයේ සාමාජීය විද්‍යාපති (ආර්ථික විද්‍යාව) පශ්චාත් උපාධිපාඨමාලාවේ පාර්ශවීය අවශ්‍යතාවක් සඳහා ඉදිරිපත් කරන ලදි.

ආර්.එම්.එන්.වනසිංහ බණ්ඩාර

FGS/E/MSSC/2006/17

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1194 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

ශ්‍රී ලංකාව

2016 ජනවාරි

## නිබන්ධන සාරාංශය

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනය සඳහා ග්‍රාමීය සංවර්ධනය අතිශයෙන්ම වැදගත්වේ. කිතුල් කර්මාන්තය ලංකාවේ ග්‍රාමීය වශයෙන් ව්‍යාප්තව ඇති කර්මාන්තයක් බැවින් එම කර්මාන්තය ග්‍රාමීය සංවර්ධනය සඳහා සිදුකරන දායකත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේශනයේ ප්‍රධාන පරමාර්ථය විය. ඊට අමතරව සංවර්ධන න්‍යායන් හා ග්‍රාමීය සංවර්ධන සංකල්පය පිළිබදව අධ්‍යයනය කිරීමත්, කිතුල් ව්‍යාප්තිය, කර්මාන්තය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන පිළිබදව අධ්‍යයනය කිරීමත් සෙසු අරමුණු විය.

ඉහත අරමුණු ඔස්සේ පර්යේශන ගැටලුවට පිළිතුරු ගවේශනය කිරීමේදී ප්‍රධාන පර්යේශන ක්‍රමය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යනයක් සිදුකරන ලදි. ඒ සඳහා අධ්‍යයන ප්‍රදේශය වශයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෝරාගන්නා ලද අතර නියදිය වශයෙන් කිතුල් නිෂ්පාදකයින් වැඩිපුර ව්‍යාප්තව ඇති ග්‍රාම නිලධාරී වසම් හතරක එක් වසමකින් පවුල් 25 බැගින් වූ පවුල් ඒකක 100 යොදාගන්නා ලදි.

මෙම පර්යේශනය තුලින් ලත් සොයාගැනීම් අතරින් ප්‍රධාන වශයෙන් කිතුල් නිෂ්පාදකයින්ගේ ජීවන තත්ත්වය ඉහල යාම කෙරෙහි කර්මාන්තයෙන් ලැබෙන ආදායම ඉවහල්වී ඇති බව තහවුරු වේ. අනෙකුත් සොයාගැනම් වන්නේ කිතුල් නිෂ්පාදනයන් සඳහා ඉහල ඉල්ලුමක් පවතින බවත් ඒ හේතුවෙන් බාල තත්ත්වයේ නිෂ්පාදන වෙළදපලට පිවිසෙන බවත්ය. දේශගුණය, තාක්ෂණය, නිෂ්පාදන ක්‍රමවේදයන් නිෂ්පාදන වල ගුණාත්මකභාවයට හා ධාරිතාවට බලපාන බවත්, නිෂ්පාදන කටයුතු සඳහා යොදාගන්නා සම්ප්‍රදායික දැනුම හා තාක්ෂණය රහසිගතව පවත්වාගෙන යාම නිසා එම දැනුම හා තාක්ෂණය අභාවයට යාමේ අවදානමක් පවතින බව සිදු කරන ලද සොයාගැනීම් අතර වේ.

ග්‍රාමීය සංවර්ධනය සඳහා කිතුල් කර්මාන්තය හේතුවී ඇති බවට මෙම පර්යේෂණය මගින් එළඹෙන ප්‍රධාන නිගමනයයි. එසේම රජය මගින් දියත් කල කිතුල් සංවර්ධන වැඩසටහන්, විවිධ දිරි ගැන්වීම්, නිති රීති හා ප්‍රතිපත්ති සම්පාදනයන් ගොවි පවුල් වල ආදායම් තත්ත්වය වර්ධනයට හේතුවී ඇති බව නිගමනය කරනු ලබයි. තවද කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා නිශ්චිත ප්‍රමිතීන් හදුන්වා නොදීම අපනයන වෙළදපල ඉලක්ක සපුරාලීමට බාදාවක්ව පවතින බව පර්යේශනයෙන් එළඹෙන නිගමන අතර වේ.

මූලික පද ( Key Words)

01 කිතුල් ව්‍යාප්තිය

02 කිතුල් නිෂ්පාදන

03 සංවර්ධනය

ග්‍රාමීය සංවර්ධනය

05 කොත්මලේ කොට්ඨාශය

Abstract

Tha rural Development is very important in a developing country like Sri Lanka. The Reserch problem is how do the Kithul industry influence to the rural development. The main objective of this Survey is to study the importance of Kithul industry in Rural areas in Sri Lanka. Inspite of the main objective development concept and theries, rural development, kithul industry, kithul palm products are to be consided in the survey.

Questionnaire survey is the predominant method of data collection. Observation method and interview method have also been adopted to triangulate data. Kotmale secretarial divisional has been selected to do the survey. The selected group consists of hundred family units from four Gramasewaka divisions selecting twenty five families from each division.

The pople who engage in the industry make their both ends meet by using the income from the industry. The government has identified Kithul industry a main rural economic developing strategy for the livelihood development, self employment, income generation and poverty reduction. It has facilitated the flow of foreign exchange directly to the village.

There is an increasing demand toward the kithul palm products. But the technology that the people use for the industry is a big issue for the production. To fulfill the demand people supply product which are not in good condition. The technology and climate effect directly to the industry. Ti decides the quality and the capacity.

The government has implemented projects to promote Kithul palm production. The experiments should be done in a proper manner to uplift the industry. At the same time new technology must be introduced. Toddy and Kithul arracek industry must be encouraged by the government.

Ti is verified that the Kithul industry has given an immence support to develop the economic condition of rural areas in Sri Lanka. Another achievement is that it has uplifted the living condition of people in rural areas in Sri Lanka. Ti is an industry that has great potential if promoted under the supervision of the government.

Key words

01 kithul Distribution

02 kithul production

03 Development

04 Rural Development

05 Kotmale Division